# පරීක්ෂණාගාර සේවා

ජාතික ප්‍රමිතිකරණ හා තත්ත්ව සහතිකකරණයේදී භාණ්ඩ පරීක්ෂා කිරීම අත්‍යාවශ්‍ය අංගයක් වන අතර ඒ වෙනුවෙන් නිවැරදි හා විශ්වාසනීය පරීක්ෂණාගාර සේවා පහසුකම් සැපයිය යුතු ය.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පරීක්ෂණාගාර සේවා අංශය පිහිටුවා ඇත්තේ මෙම අවශ්‍යතාවය ඉටුකර ගැනීම සඳහා ය.

රසායනික, ආහාර, විද්‍යුත් හා විදුලි, ද්‍රව්‍ය, ක්ෂුද්‍ර ජීවී හා රෙදිපිළි යන පරීක්ෂණාගාර හයකින් (06) සමන්විත මෙම අංශයේ ඉතා පළපුරුදු හා සුදුසුකම් ලත් සේවක සේවිකාවන් 80ක් සේවය කරයි. ඒ අතරින් උපාධිධාරී හා පශ්චාත් උපාධිධාරීන් 25ක් පමණ වේ. මෙම පරීක්ෂණාගාරය නවීනතම උපකරණ වලින් සමන්විතය.

අන්තර්ජාතික, ජාතික හෝ වෙනත් ප්‍රමිතීන්ට අනුකූලව භාණ්ඩ පරීක්ෂා කිරීම මෙම අංශයේ මූලික කාර්යය වේ. පරීක්ෂණාගාරවල සේවය කරන්නන් වෙනුවෙන් තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩ සටහන් පැවැත්වීම මෙම අංශය මගින් කෙරෙන තවත් විශේෂ සේවාවක් වේ.

පරීක්ෂණාගාර සේවකයින් පුහුණු කිරීමේ වැඩ සටහන් අතර රසායනික, ක්ෂුද්‍ර ජීවී, රෙදිපිළි හා වෙනත් පරීක්ෂණාගාර වල සේවය කරන්නන් හට පරීක්ෂණ පැවැත්වීම සඳහා අවශ්‍ය වන සෛද්ධාන්තික හා ප්‍රායෝගික දැනුම ලබාදීම මූලික තැනක් ගනී. මේ හැරුන විට ISO/IEC 17025 ප්‍රධාන පරීක්ෂණාගාර තත්ත්ව කළමනාකරණය සඳහා වැදගත් වන පද්ධති සම්බන්ධ වැඩසටහන්ද මෙම අංශය මගින් පවත්වනු ලබයි.

පරීක්ෂණාගාර සේවා අංශයේ ISO/IEC 17025 අනුකූල තත්ත්ව පද්ධතියක් පසුබිම් කොට පවත්වාගෙන යනු ලබයි. තවද රසායනික හා ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණාගාර වලට ස්වීඩනයේ ප්‍රතීතකරණය හා අනුකූලතා ඇගයීම් මණ්ඩලය (SWEDAC) මගින් ප්‍රතීතකරණ තත්ත්වය ලබා දී ඇත.

# තත්ත්ව ප්‍රතිපත්තිය

***පරීක්ෂණාගාර සේවා අංශය කැපවීමෙන් යුතුව :***

- සේවා දායක අවශ්‍යතාවයන්ට සරිලන පරිදි හා විශ්වසනීය ලෙස පරීක්ෂණ කටයුතු සහ අනෙකුත් ආශ්‍රිත සේවා ප්‍රවීණතාවයෙන් යුක්තව සැම විටම නිසි වේලාවට සැපයීම,
- පරීක්ෂණාගාර ක්‍රියාකාරීත්වයෙහි අභිවෘද්ධිය උදෙසා කාර්ය මණ්ඩලයේ දායකත්වය සැපයෙන පරිදි හිතකර වාතාවරණයක් පරීක්ෂණාගාර සේවා අංශය තුල ඇති කිරීම, සහ
- ISO/IEC 17025 ප්‍රමිතිය පාදක කරගත් පරීක්ෂණාගාර කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීම තුලින් සේවක කුසලතා වැඩි දියුණු කිරීම සහ පරීක්ෂණ කටයුතු විධිමත් කිරීම